# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2183/29 – 2020 ජූලි 08 වැනි බදාදා – 2020.07.08**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/J/2015/196.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

දිනුක පෙරේරා මයා, අංක 42, දඹුල්ල පාර, තෝරයාය, කුරුණෑගල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී, අංක 181/1 ඒ, ධර්මපාල මාවත, කොළඹ 07.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය, දිනේෂ් ගුණවර්ධන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බදුල්ල, සිල්වර්ලෑන්ඩ්, හිඟුරුගමුව පාර, ''සෞම්‍යා'', අංක 417, ඩී. එම්. කරුණාරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2020 අප්‍රේල් මස 03 වැනි දින,
කොළඹ දී ය.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/01/J/2015/196.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

දිනුක පෙරේරා මයා, අංක 42, දඹුල්ල පාර, තෝරයාය, කුරුණෑගල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී, අංක 181/1 ඒ, ධර්මපාල මාවත, කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ –**

"සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ආයතනයේ සේවකයකුව සිටි දිනුක පෙරේරා මහතාට 2013 නොවැම්බර් මස ඉන්ධන වියදම ප්‍රතිපූර්ණය නොකිරීමෙන් ද, 2013 අප්‍රේල් හා මැයි මාස සඳහා වාහන දීමනාව නොගෙවීමෙන් ද, වෛද්‍ය රක්ෂණ ක්‍රමය යටතේ ඉල්ලා සිටින ප්‍රතිලාභ නොගෙවීමෙන් ද, අසාධාරණයක් සිදු වී තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදු වී ඇත්නම් හිමිවිය යුතු සහන කවරේ ද?" යන්න පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ජනවාරි මස 27 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 – 568

---

මගේ අංකය: IR/COM/04/V/2015/154.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2019.03.07 වන දින අංක 2113/56 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.02.28 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එම්. අයි. පී. කුලතිලක මිය, ''උපමාලි'', බෙරගල, කෑගල්ල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, 1 වෙනි මහල, කම්කරු මහලේකම් කාර්යාලය, කොළඹ 05.

අතර පවත්නා 2019.02.21 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එස්. ජී. සූරියආරච්චි මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2019.02.28 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2019 දෙසැම්බර් මස 26 වැනි දින,
කොළඹ දී ය.

07 - 607/1

මගේ අංකය: IR/COM/04/V/2015/154.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්*

එම්. අයි. පී. කුලතිලක මිය, ''උපමාලි'', බෙරගල, කෑගල්ල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්*

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, 1 වෙනි මහල, කම්කරු මහලේකම් කාර්යාලය, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය, දිනේෂ් ගුණවර්ධන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කැලණිය, දළුගම, පරණ නුවර පාර, අංක 123/6, එම්. ඊ. ජී. සමරවීර මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2019 දෙසැම්බර් මස 26 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/V/2015/154.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්*

එම්. අයි. පී. කුලතිලක මිය, ''උපමාලි'', බෙරගල, කෑගල්ල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්*

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, 1 වෙනි මහල, කම්කරු මහලේකම් කාර්යාලය, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ –

"සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ III ශ්‍රේණියේ විධායක නිලධාරි තනතුරක සේවය කළ එම්. අයි. පී. කුලතිලක මිය ඊට පහළ ශ්‍රේණියක් වූ කණිෂ්ඨ කළමනාකාර තනතුරේ පිහිටුවීමෙන් වැටුප්, වාර්ෂික වැටුප් වර්ධක, අනෙකුත් වරප්‍රසාද හා උසස්වීම් අහිමි වීමෙන් අසාධාරණයක් සිදුවී ඇත් ද? යන්න හා, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමි විය යුතු සහන කවරේ ද?" යන්න පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 දෙසැම්බර් මස 13 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 – 607/2

මගේ අංකය: IR/COM/05/2019/90.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩබ්. පී. සරත් මයා, අංක 487/ඒ, සුසිලාරාම පාර, මාලබේ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

මධ්‍යම සංස්කෘතික අරමුදල, II අදියර, 4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය, දිනේෂ් ගුණවර්ධන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පිළියන්දල, කැස්බෑව, සර්වෝදය මාවත, අංක 13/30, සරත් ලියනගේ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2020 අප්‍රේල් මස 03 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/2019/90.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩබ්. පී. සරත් මයා, අංක 487/ඒ, සුසිලාරාම පාර, මාලබේ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

මධ්‍යම සංස්කෘතික අරමුදල, II අදියර, 4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ –

"මධ්‍යම සංස්කෘතික අරමුදලේ අභ්‍යන්තර විගණක ඩබ්. පී. සරත් මහතා වැඩ තහනමට ලක්කිරීමෙන් හා එම කාලයට අදාළව වැටුප් නොගෙවීමෙන් ඔහුට අසාධාරණයක් සිදුවී තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේනම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද?" යන්න පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ජනවාරි මස 09 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 – 608

මගේ අංකය: IR/COM/01/2016/151.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දූන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2019.08.26 වන දින අංක 2138/04 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.08.20 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. කාන්ති කළුආරච්චි මෙනෙවිය, අංක 62/25, කටුකුරුන්ද වත්ත, මාවරමණ්ඩිය, කඩවත.
2. සුනිල් රත්නසිරි මයා, අංක 22/14, අරලිය උයන, දෙපානම, පන්නිපිටිය.
3. ටයිටස් පෙරේරා මයා, අංක 76/1 බී, ශ්‍රී ධර්මාරාම පාර, රත්මලාන.
4. ඊ. ඩී. කුමුදිනී මිය, අංක 493, කටුකුරුඳුවත්ත, ගල්කිස්ස.
5. ඩී. එම්. ජයවීර මයා, අංක 93/6, මීගහවත්ත පාර, දෙල්ගොඩ.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

අතර පවත්නා 2019.08.09 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එස්. ජී. සූරියආරච්චි මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2019.08.20 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2020 මාර්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

07 - 609/1

---

මගේ අංකය: IR/COM/01/2016/151.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. කාන්ති කළුආරච්චි මෙනෙවිය, අංක 62/25, කටුකුරුන්ද වත්ත, මාවරමණ්ඩිය, කඩවත.
2. සුනිල් රත්නසිරි මයා, අංක 22/14, අරලිය උයන, දෙපානම, පන්නිපිටිය.
3. ටයිටස් පෙරේරා මයා, අංක 76/1 බී, ශ්‍රී ධර්මාරාම පාර, රත්මලාන.
4. ඊ. ඩී. කුමුදිනී මිය, අංක 493, කටුකුරුඳුවත්ත, ගල්කිස්ස.
5. ඩී. එම්. ජයවීර මයා, අංක 93/6, මීගහවත්ත පාර, දෙල්ගොඩ.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය, දිනේෂ් ගුණවර්ධන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බදුල්ල, සිල්වර්ලැන්ඩ්, හිඟුරුගමුව පාර, ''සෞම්‍යා'', අංක 417, ඩී. එම්. කරුණාරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2020 මාර්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2016/151.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. කාන්ති කළුආරච්චි මෙනෙවිය, අංක 62/25, කටුකුරුන්ද වත්ත, මාවරමණ්ඩිය, කඩවත.
2. සුනිල් රත්නසිරි මයා, අංක 22/14, අරලිය උයන, දෙපානම, පන්නිපිටිය.
3. ටයිටස් පෙරේරා මයා, අංක 76/1 බී, ශ්‍රී ධර්මාරාම පාර, රත්මලාන.
4. ඊ. ඩී. කුමුදිනී මිය, අංක 493, කටුකුරුඳුවත්ත, ගල්කිස්ස.
5. ඩී. එම්. ජයවීර මයා, අංක 93/6, මීගහවත්ත පාර, දෙල්ගොඩ.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ –**

"ඉහත නම් සඳහන් සේවකයින් පස්දෙනා හට විධායක II ශ්‍රේණියේ කළමනාකරු (මුදල්) තනතුරෙහි සිට විධායක 1 ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මුදල්) තනතුර දක්වා උසස්වීමේ අවස්ථාව අහිමි කිරීම මගින් එකී සේවකයන්ට යම් අසාධාරණයක් සිදු වූයේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුවූයේ නම් ඔවුන් එකිනෙකාට ලැබිය යුතු සහනයන් මොනවා ද?" යන්න පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ජනවාරි මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 – 609/2

මගේ අංකය: IR/COM/02/2018/182.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

ලංකා වතු සේවා සංගමය, ප්‍රාදේශීය කාර්යාලය, අංක 23ඒ, මල්වල පාර, රත්නපුර. (රමණී ජයකොඩි මිය වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

1. ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය, ශාන්ත කූම්බස්, තලවකැලේ.
2. ශාන්ත ජෝකිම් වත්ත, රත්නපුර.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය, දිනේෂ් ගුණවර්ධන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කැලණිය, දළුගම, පරණ නුවර පාර, අංක 123/6, එම්. ඊ. ජී. සමරවීර මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2020 අප්‍රේල් මස 20 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2018/182.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

ලංකා වතු සේවා සංගමය, ප්‍රාදේශීය කාර්යාලය, අංක 23ඒ, මල්වල පාර, රත්නපුර. (රමණී ජයකොඩි මිය වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

1. ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය, ශාන්ත කූම්බස්, තලවකැලේ.
2. ශාන්ත ජෝකිම් වත්ත, රත්නපුර.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ –**

"ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයට අයත් ශාන්ත ජෝකිම් වත්තේ සේවය කරන රමණී ජයකොඩි මහත්මියට පෙර ලබා දී ඇති පදනමින් 2013.10.01 දින සිට ක්‍රියාත්මක වූ වැටුප් වර්ධක ලබා දීම 2014.05.01 දින සිට අත්හිටුවීමෙන් අසාධාරණයක් සිදු ව තිබේ ද? එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනය කුමක් ද?" යන්න පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 – 610

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.